# ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

## අභියෝගතා පරීක්ෂණය - අධ්‍යයන වර්ෂ 2022/2023

අභියෝගතා පරීක්ෂණය 2022/2023 ශිෂ්‍ය ප්‍රවේශය සඳහා 2023 සැප්තැම්බර් 10 දින සිළුමිණ පත්‍රයෙහි පලවූ පුවත්පත් දැන්වීම් හා බැඳේ.

උක්ත අභියෝගතා පරීක්ෂණය සඳහා අයදුම්පත් භාර ගැනීම 2023 සැප්තැම්බර් 29 දින දක්වා දීර්ඝ කර ඇති බව දන්වා සිටිමි.

වැඩි විස්තර සඳහා www.uwu.ac.lk වෙබ් පිටුව වෙත පිවිසෙන්න.

ලේඛකාධිකාරී<br>
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය<br>
පස්සර පාර<br>
බදුල්ල<br>
2023.09.20

# ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
# ශිෂ්‍ය ප්‍රවේශය
# අධ්‍යයන වර්ෂය - 2022/2023

## අභියෝග්‍යතා පරීක්ෂණය

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති " 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය'' පිළිබඳ වූ අත්පොතෙහි 1.2 වගන්තියට අනුව සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පහත සඳහන් උපාධි පාඨමාලා වලට ඇතුළත්වීම සඳහා අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- පරිගණක විද්‍යාව සහ තාක්ෂණය
- කාර්මික තොරතුරු තාක්ෂණය
- ව්‍යවසායකත්වය සහ කළමනාකරණය
- ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය

ඉල්ලුම් කරන ලද වැඩසටහනට අදාළ අපේක්ෂකයින්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා මෙම පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

එක් එක් උපාධි පාඨමාලාව සඳහා අයදුම් කිරීමට අවශ්‍ය අවම සුදුසුකම් ඉහත සඳහන් අත්පොතෙහි 2.2.8.14, 2.2.8.15, 2.2.8.16 සහ 2.2.8.18 වගන්තිවල සඳහන් වේ.

අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා වන අයදුම් පත්‍රය **2023 සැප්තැම්බර් 20** දින හෝ ඊට පෙර https://www.aptitude.uwu.ac.lk/ හරහා මාර්ගගතව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටින අතර සබැඳි අයදුම්පත සමඟ පහත ලිපි ලේඛන උඩුගත කළ යුතුය.

i. එක් විභාග ප්‍රශ්න පත්‍රයක් සඳහා රු 1000/- බැගින් ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 78166821, ලංකා බැංකුව, බදුල්ල ශාඛාවට බැර කරන ලද බැංකු රිසිට් පතෙහි ස්කෑන්කල කළ පිටපතක් (කරුණාකර මෙම රිසිට්පතේ ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගන්න). මෙම ගාස්තුව නැවත ගෙවනු නොලැබේ. [උදා: ඔබ විෂයයන් දෙකක් සඳහා පෙනී සිටීමට කැමති නම්, ගාස්තුව රු 2000/- (2 x රු 1000/- ) වනු ඇත]

අභියෝග්‍යතා පරීක්ෂණය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලබන අතර සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර විද්‍යුත් මාර්ගයෙන් යවනු ලැබේ.

සියලුම විභාග ප්‍රශ්න පත්‍ර සඳහා එක් අයදුම්පත්‍රයකින් අදාළ විභාග ගාස්තු සහිතව අයදුම් කරන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

විභාගය සඳහා ගෙවන ලද මුදල අයදුම් කරන ලද විභාග ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාවට වඩා අඩු නම්, අපේක්ෂකයා දක්වා ඇති කැමැත්තෙහි අනුපිළිවෙල අනුව ලබා දිය හැකි ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව පමණක් සලකා බලනු ලැබේ. අභියෝග්‍යතා පරීක්ෂණය පවත්වනු ලබන මධ්‍යස්ථාන සහ ඊට අදාළ මධ්‍යස්ථාන අංකයන් පහත සඳහන් කර ඇත. කරුණාකර ඔබට වඩාත් පහසු මධ්‍යස්ථානය තෝරන්න.

| මධ්‍යස්ථානය | මධ්‍යස්ථාන අංකය |
|---|---|
| කොළඹ | 01 |
| යාපනය | 02 |
| නුවර | 03 |
| මාතර | 04 |
| බදුල්ල | 05 |
| අනුරාධපුර | 06 |
| මඩකලපුව | 07 |
| කුරුණෑගල | 08 |

ඔබ අයදුම් කරන විභාග මධ්‍යස්ථානය ඔබවෙත ලබාදීමට නොහැකි විට ඒ සඳහා සුදුසු වෙනත් විභාග මධ්‍යස්ථානයක් ලබාදෙනු ලැබේ.

**ලේඛකාධිකාරී**
**ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය**
**පස්සර පාර බදුල්ල**
**06.09.2023**

දුරකථන අංක 055-2226622,055-3521756
ෆැක්ස් 055-2226633
වෙබ් අඩවිය www.uwu.ac.lk